# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1854/47 - 2014 මාර්තු මස 21 වැනි සිකුරාදා - 2014.03.21**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී - 5/83.

**1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත**

11 වැනි වගන්තිය යටතේ වූ නියමය

1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනතේ 11 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්, ගමගේ අනුර වික්‍රමසිරි විජේසේකර වන මා විසින්, මේ නියමය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රසායනික සංෂිප්ත සේවාවේ ලියාපදිංචි අංක  දරන සක්‍රීය රස ද්‍රව්‍ය අන්තර්ගත වන පළිබෝධ නාශක සම්බන්ධයෙන් නිකුත් කර ඇති සෑම බලපත්‍රයක්ම අවලංගු කරනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය ජී. ඒ. ඩබ්. විජේසේකර,
පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්

2014 මාර්තු මස 03 වැනි දින,
පේරාදෙණියේ දී ය.

**උපලේඛනය**

| *සක්‍රීය රස ද්‍රව්‍ය* | *රසායනික සංෂිප්ත සේවාවේ ලියාපදිංචි අංක* |
|---|---|
| ඇලැක්ලෝර් | 15972-60-8 |
| සයිරොමසින් | 66215-27-8 |
| පැරකොට් | 4685-14-7 |
| ඩයිමෙතොඒඩ් | 60-51-5 |
| ෆෙන්තියොන් | 55-38-9 |

04-204


1A - PG 2007— 310 (2014/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*